වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

45 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Second Term Test - Grade 13 - 2018

විභාග අංකය ............................ බෞද්ධ ශිෂ්ටාචාරය I කාලය පැය දෙකයි

වැදගත්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා එය සලකුණු කරන්න.

01. වර්ණ ධර්මවලට හිමි ස්වධර්මයෙන් බැහැර ව වෙනත් වර්ණයක කටයුතු කිරීමේ හැකියාව,
 1. ආශ්‍රම ධර්මයයි. 2. ස්වධර්මයයි. 3. ආපද්ධර්මයයි.
 4. නියාම ධර්මයයි. 5. යඥ කර්මයි.

02. පශ්චාත් වෛදික යුගයේදී ස්වාමියා මළ ස්ත්‍රිය විසින් සිදුකළ යුතු පිළිවෙතක් වූයේ,
 1. බ්‍රහ්ම වන්දනයයි. 2. යාග පූජාවයි. 3. නැවත විවාහවීමයි.
 4. ජගත් මාතා වන්දනයයි. 5. සති පූජා පැවැත්මයි.

03. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව වෛශ්‍ය වර්ණයට අයත් නොවන ස්වධර්මය ඇතුළත් වන්නේ,
 1. ඉගැන්වීම හා රාජ්‍ය පාලනයයි. 2. ඉගෙනීම හා වෙළඳාමයි.
 3. දන්දීම හා කෘෂිකර්මාන්තයයි. 4. වෙළඳම හා පශු පාලනයයි.
 5. යාග කිරීම හා මුදල් කටයුතුයි.

04. බ්‍රාහ්මණ නියමය පරිදි වර්ණ මැවීමේදී මහාබ්‍රහ්මයාගේ බාහුවෙන් මවනු ලැබුවේ,
 1. බ්‍රාහ්මණයන් ය. 2. ක්ෂත්‍රියයන් ය. 3. වෛශ්‍යයන් ය.
 4. ශුද්‍රයන් ය. 5. චණ්ඩාලයන් ය.

05. බුද්ධ කාලීනව ප්‍රකට ශාස්තෘවරු හය දෙනෙකු ලෙස ෂට් ශාස්තෘන් පෙන්වා දිය හැකි ය. ඔවුන්ගේ ඉගැන්වීම් ඇතුළත් බෞද්ධ මූලාශ්‍රය වන්නේ,
 1. අග්ගඤ්ඤ සූත්‍රයයි. 2. චක්කවත්ති සීහනාද සූත්‍රයයි. 3. පරාභව සූත්‍රයයි
 4. සාමඤ්ඤඵල සූත්‍රයයි. 5. බ්‍රහ්මජාල සූත්‍රයයි.

06. බුද්ධ කාලීන භාරතීය සමාජයේ විසූ ශ්‍රමණයෝ, බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට දැඩිසේ විරෝධතාකල්ප දැක්වූහ. මේ ශාස්තෘන් අතර නියතිවාදී අදහස් ඉදිරිපත් කළ ශාස්තෘවරයා ලෙස හඳුනාගත හැක්කේ,
 1. පූර්ණකාශ්‍යපතුමන් ය. 2. මක්ඛලී ගෝසාලතුමන් ය.
 3. අජිතකේශකම්බිලිතුමන් ය. 4. පකුධ කච්චායනතුමන් ය.
 5. සංජයබෙල්ලට්ඨිපුත්තතුමන් ය.

07. මගධ, කෝසල, වත්ස, අවන්ති යනු භාරතයේ පැවති මහා රාජ්‍යයන්ය. බුදුරදුන් දවස කෝසල රාජධානියේ සිටි පාලකයා හා අගනගරය ලෙස දැක්විය හැක්කේ,
1. බිම්බිසාර රජ හා පාඨලීපුත්‍ර නගරයයි. 2. උදේන රජ හා සැවැත් නුවරයි.
3. කොසොල් රජ හා රජගහ නුවරයි. 4. කොසොල් රජ හා මගධයයි.
5. කොසොල් රජ හා සැවැත් නුවරයි.

08. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවු පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න පිරිසක් වනතුරු තමන් වහන්සේ පිරිනිවන් නොපාන බව ප්‍රකාශ කළේ,
1. මාරයාට ය. 2. මාරදූවරුන්ට ය 3. ආනන්ද තෙරුන්ට ය.
4. අජාසත්ත රජුට ය. 5. දෙවිවරුන්ට ය.

09. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනු සප්ත පදාර්ථයන් ය. මේවා කිසිවකු විසින් නොකරන ලද නූපදන ලද, ස්ථිර නිශ්චල දෑ ලෙස බුද්ධ කාලීනව උගන්වනු ලැබුවේ,
1. අජිතකේශකම්බිලි ය. 2. නිගණ්ඨනාථපුත්ත ය. 3. පූර්ණ කාශ්‍යප ය.
4. පකුධකච්චායන ය. 5. සංජය පිරිවැජියා ය.

10. විශ්ව සම්භවය හා මානව සංස්ථාවන්හි විකාශය පිළිබඳ විවිධ මත හා පුරාවෘත්තීන් රාශියක් මේ වන විට ගොඩනැගී ඇත. ඒ සම්බන්ධව බුදු දහම ඉදිරිපත් කරන අදහස ඇතුළත් වන්නේ,
1. දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ ය. 2. දීඝ නිකායේ පායාසි සූත්‍රයේ ය.
3. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ ය. 4. දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍රයේ ය.
5. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

11. ව්‍යාපාරයක් දියුණුකර ගැනීමේ දී මනා කළමනාකාරීත්වයෙන් කටයුතු කළයුතු බව අංගුත්තර නිකායේ කුල සූත්‍රයෙහි දක්වා ඇත. එම සම්පත් දියුණුවට හේතුවන කරුණු හතරට අයත් නොවන වරණය තෝරන්න.
1. ව්‍යාපාරයන්හි නොඇලී කටයුතු කිරීම. 2. විනාශ වූ දේ යළි සම්පාදනය කරගැනීම.
3. සදාචාරවත් අයෙක් ප්‍රධානත්වයේ තැබීම. 4. පමණ දැන පරිභෝග කිරීම.
5. දිරායන පරණ වන දේ ප්‍රතිසංස්කරණය කිරීම.

12. එක්තරා අවස්ථාවකදී බුදුරජාණන් වහන්සේ භික්ෂුණීන් වහන්සේ නමකගේ හරබර ධර්ම දේශනාවක් අසා ''ඇය පණ්ඩිතය, මහා ප්‍රඥාවන්තය, මා ඔය කරුණු විවරණය කළා නම් විවරණය කරන්නේ ද ඇය විවරණය කළ ආකාරයට ම ය.'' යනුවෙන් ප්‍රශංසා ලැබූ තෙරණිය වන්නේ,
1. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි. 2. ධම්මදින්නා තෙරණියයි.
3. පටාචාරා තෙරණියයි. 4. ඛේමා තෙරණියයි.
5. උප්පලවන්නා තෙරණියයි.

13. ශ්‍රැති සාහිත්‍යය පදනම් කරගත් ගතානුගතික බ්‍රාහ්මණ චින්තනයට ප්‍රතිපක්ෂ ව සිතීමට පෙළඹුණු ෂඩ් ශාස්තෘන්ගෙන් සංසාර ශුද්ධිවාදය හා අමරාවික්ෂේපවාදය පිළිගත් ශාස්තෘවරු දෙදෙනා නම්,
1. සංජයබෙල්ලට්ඨිපුත්ත හා පූරණකස්සප ය. 2. මක්ඛලීගෝසාල හා පකුධකච්චායන ය.
3. මක්ඛලීගෝසාල හා සංජයබෙල්ලට්ඨිපුත්ත ය 4. නිගණ්ඨනාථපුත්ත හා අජිතකේසකම්බලී ය.
5. පකුධකච්චායන හා පූරණකස්සප ය.

14. බුද්ධකාලය වන විට සොළොස්මහා ජනපද අතරින් මගධ රාජ්‍ය බලතරගයෙන් ඉදිරියට යමින් තිබුණි. මෙම රාජ්‍යයේ භෞගෝලීය පිහිටීම අනුව 'ගිරිබ්බජ' නමින් ද ප්‍රකට වූයේ,
1. පර්වත පහකින් වට වූ නිසා. 2. පරිබ්‍රාජකයන්ගෙන් ගැවසීගත් නිසා
3. පබ්බජිතයන්ට තෝතැන්නක් වූ නිසා. 4. ගිරි නිගණ්ඨයා සිටි නිසා.
5. ගංගා පහකින් වට වූ නිසා.

15. අංගුත්තර නිකාය දුක නිපාතයේ අධිකරණ වග්ගයේ ඇති 'මහණෙනි, කුසලය වැඩිය නොහැකිනම්, කුසලය වඩව්' කියා මම මෙසේ නොකියමි. මහණෙනි, කුසල ය වැඩිය හැකි නිසා ම කුසලය වඩව් කියා මම මෙසේ කියමි.' යන දේශනයෙන් ප්‍රකට වන අදහසට වඩාත් නිවැරදි වරණය නම්,
1. අකුසලය වැඩිය හැකි බවයි.
2. කුසල් - අකුසල් ඊශ්වර නිර්මාණවාදී බවයි.
3. පුද්ගලයා සතු ශක්තිය හා ස්වාධීනතාවයි.
4. නිදහස් චින්තනය නිරර්ථක බවයි.
5. බුද්ධදේශනා අනිවාර්යයෙන් ම පිළිගත යුතු බවයි.

16. බුදුරජාණන් වහන්සේ සිව් කුලය ම නියෝජනය කරමින් පැවැදි පිරිස ගොඩනගන ලදහ. විවිධ ආගම් ජාති, කුල නියෝජනය කරමින් එම පිරිස පැවිදි වුව ද ඔවුන්ගේ ඇවතුම් පැවතුම් චර්යා රටා තුළ විවිධත්වයක් විද්‍යාමාන වූයෙන් එය සැදැහැ ඇති දායකයන්ගේ සිත් නොසතුටට පත් කරවන්නක් විය. එම නවක පැවිද්දන් ක්‍රමානුකූල පිරිසක් ප්‍රසන්න පිරිසක් කිරීමට ප්‍රාතිමෝක්ෂයේ 'සේඛියා' නමින් ශික්ෂාපද හඳුන්වාදී ඇත. ඒවා ගණනින්,
1. 50 යි.
2. 75 යි.
3. 100 යි.
4. 125 යි.
5. 227 යි.

17. භික්ෂුවගේ සනීපාරක්ෂාව, ප්‍රත්‍ය පහසුව හා ශික්ෂාකාමීත්වය පිළිබඳව ද සලකා වස් විසීමට අදාළ නියමයන් පනවා ඇත. ඇසළ පුර පසළොස්වක පොහෝ දිනනේ පසු දිනයෙන් හෙවත් අව පැළවියෙහි පෙරවස් සමාදන් වන උපසම්පදා භික්ෂුව වස් පවාරණය කරනු ලබන්නේ,
1. වප්පුර පසළොස්වක පොහෝ දිනට පසු එළඹෙන අව පැළවිය දිනයි.
2. වප් පුර පසළොස්වක පොහොය දිනයි.
3. නිකිණි පුරපසළොස්වක පොහොය දිනයි.
4. බිනර පුරපසළොස්වක පොහොය දිනයි.
5. බිනර අව පැළවිය දිනයි.

18. සිරිසෝම තුනුරුවන් කෙරෙහි සැදැහැසිතින් දානය රැගෙන විහාරයට යනවිට දිවයිනේ ප්‍රකට ස්වාමීන් වහන්සේ නමක් ධර්ම දේශනාවක් පවත්වමින් සිටියහ. මේ අතර සිරිසෝම ද ධර්ම දේශනාව ඇසීමට වාඩිවිය. දේශනාව අවසානයේ මෛත්‍රී භාවනාව වඩා මිය ගිය ඥාතීන්ට පිංදීම සිදුකරන ලදී. ඔහු ස්වාමීන් වහන්සේට වතාවත් දක්වා රැස්ව සිටි ගිහි වැඩිහිටියන්ට ද සැලකීමට අමතක නොකළේ ය. විහාරයට ගිය සිරිසෝම සම්පූර්ණ කර ඇති දස පුණ්‍ය ක්‍රියාවල එකතුව වන්නේ,
1. 6කි.
2. 7කි.
3. 8කි.
4. 9කි.
5. 10කි.

19. වරක් සිදුහත් තවුසා භාවනානුයෝගී ව උරුවෙල් ජනපදයේ වාසය කරනවිට එම ස්ථාන කොතරම් සිත් කළු රමණීය තැනක්ද යන්න පහත ප්‍රකාශයෙන් පැහැදිළි වේ.

''එම ස්ථානය රමණීයයි. සිත් පුබුදු කරවන සුපිපි කුසුමින් හා විහඟුන්ගේ මිහිරි නාදයෙන් යුක්ත වන ලැහැබෙකි. සුපිරිසිදු සුදෝ සුදු ජලධාරාවන්ගෙන් යුත් ගංගාවකි. ගඟ දෙපස පිරිසිදු වැලිතලා ය.''

බුදුරදුන්ගේ සිත් ගත් මේ අවට පරිසරය විස්තර වන්නේ,
1. පරිනිබ්බාණ සූත්‍රයේ ය.
2. සාමඤ්ඤඵල සූත්‍රයේ ය.
3. රාහුලෝවාද සූත්‍රයේ ය.
4. අරියපරියේසන සූත්‍රයේ ය.
5. සක්කපඤ්හ සූත්‍රයේ ය.

20. බුදුරජාණන් වහන්සේ තමන් වෙත ඉදිරිපත් වූ ප්‍රශ්න විසඳීමට චතුර්විධ ක්‍රමවේදයක් අනුගමනය කළහ. මෙහිදී ප්‍රශ්නකරුගෙන් ප්‍රති ප්‍රශ්න අසමින් පිළිතුරු දී විසඳනු ලැබූ ක්‍රමවේදය හඳුන්වනු ලබන්නේ,
1. ඒකංසව්‍යාකරණ ක්‍රමයයි.
2. විභජ්ජව්‍යාකරණ ක්‍රමයයි.
3. පටිපුච්ඡාව්‍යාකරණ ක්‍රමයයි.
4. ඨපනීය ක්‍රමයයි.
5. පරජ්ඣාසය ක්‍රමයයි.

21. බුදුරජාණන් වහන්සේ තම පැවිදි සමූහයා උපසම්පදා කිරීමේ නියමය ශ්‍රාවක කේන්ද්‍රීය කරමින් ''සරණාගමන උපසම්පදාව හඳුන්වා දෙන ලදී.'' අනතුරුව ''මහණෙනි, මා විසින් තුන්සරණ ගැන්වීමෙන් යම් ඒ උපසම්පදාවක් අනුදක්නා ලද ද ඒ උපසම්පදාව අද පටන් මම ප්‍රතික්ෂේප කරමි.'' යනුවෙන් මහාවග්ගපාලියේ සඳහන් වේ. එම උපසම්පදා ක්‍රමය බැහැර කළ බුදුරජාණන් වහන්සේ අනතුරුව හඳුන්වාදුන් උපසම්පදා ක්‍රමය වන්නේ,
1. පඤ්හ ව්‍යාකරණ උපසම්පදාවයි.
2. අට්ඨවාචික උපසම්පදාවයි.
3. දූතේන උපසම්පදාවයි.
4. ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාවයි.
5. ඕවාද පටිග්ගහණ උපසම්පදාවයි.

22. බුද්ධකාලීන භාරතය සොළොස් මහා ජනපදවලට බෙදී තිබුණ බව විසාඛ උපොසථ සූත්‍රයේ දක්නට ලැබෙන අතර, මෙම රාජ්‍ය අතරෙන්, වජ්ජි රාජ්‍යය ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් පැවැති රාජ්‍යයකි. වජ්ජි රාජ්‍යයේ සම්බන්ධ ශාසනික සිදුවීමක් වන්නේ,
1. බුදුරදුන් තෙවන වස්කාලය ගත කිරීමයි.
2. බුදුරදුන් අනමතග්ග සූත්‍රය දේශනා කිරීමයි.
3. මහා සතිපට්ඨාන සූත්‍රය දේශනා කිරීමයි.
4. රාජ්‍ය භටයින් පැවිදි නොකිරීමට විනය නීති පැණවීමයි.
5. භික්ෂුණී ශාසනය පිහිටුවීමට අදාළ කටයුතු සිදු කිරීමයි.

23. සිගාලෝවාද සූත්‍රයේ එන යුතුකම් හා වගකීම් යහපත් සමාජයක් විෂයෙහි කැඩපතක් බඳු ය. ඒ අතර ''පාපයෙන් වැළැක්වීම, යහපතෙහි යෙදවීම, ශිල්ප ඉගැන්වීම යන යුතුකම් ඉටුවනු ලබන්නේ,
1. ගුරුවරුන්ගෙන් සිසුන්ට ය.
2. මාපියන්ගෙන් දූදරුවන්ට ය.
3. ස්වාමියාගෙන් භාර්යාවට ය.
4. පැවිද්දන්ගෙන් ගිහියන්ට ය.
5. ස්වාමියාගෙන් සේවකයන්ට ය.

24. සියලු කාර්යයන්හි සාර්ථකත්වය ලැබීමට අවශ්‍ය සියලු ශක්තීන් මිනිසා තුළ උපතින් ම පිහිටා ඇති බව බුදුසමය පෙන්වා දෙයි. ඒවා ජීවවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සහජ සම්පත් ද වෙයි. එයින් ''ථිතිධාතු'' යන්නෙහි අර්ථය තෝරන්න.
1. උපාය ශක්තියෙන් යුක්ත වීම.
2. නොකඩවා නිරත වීමේ ස්ථිර වීර්යයෙන් යුක්තවීම.
3. ආරම්භ කිරීමේ ශක්තිය.
4. බාධා මැඩගෙන ඉදිරියට යෑමේ ප්‍රවේගය
5. බලවත් වීර්යයෙන් යුක්තවීම.

25. බුදුරජාණන් වහන්සේ තමාගේත් අන්‍යයන්ගේත් පෙර විසූ ස්කන්ධ පිළිවෙළ දැකීමේ ඥාණයෙන් සමන්විත වූ සේක. මෙම ඥාණය අයත් ඥාණ කාණ්ඩය නම්,
1. පසළොස්චරණ ධර්මයි.
2. චතුර් වෛශාරද්‍ය ඥාණයයි.
3. නව අරහාදී බුදුගුණයි.
4. අෂ්ටවිද්‍යා ඥාණයයි.
5. උපාය කෞශල්‍ය ඥාණයයි..

26. විශිෂ්ට හා අසහාය සන්නිවේදනය කෞශල්‍යයකින් හෙබි බුදුරජාණන් වහන්සේ විවිධ ධර්ම දේනා ක්‍රම අවස්ථානුකූල ව හා පුද්ගලානුරූප ව යොදාගත් සේක. ඒ අතර පැවරුම් දේශනා ක්‍රමය යොදාගත් අවස්ථාවකට නිදසුනක් නම්,
1. දම්සක් පැවතුම් සූත්‍ර දේශනා අවස්ථාව
2. කන්දරක සූත්‍ර දේශනා අවස්ථාව
3. රාහුලෝවාද සූත්‍ර දේශනා අවස්ථාව
4. බ්‍රහ්මජාල සූත්‍ර දේශනා අවස්ථාව
5. චුල්ලපන්තක හිමිට ධර්ම දේශනා කළ අවස්ථාව.

27. බුදුසමය වූකලී ප්‍රඥාවන්තයින්ට ගෝචර වන දහමකි. ප්‍රඥාව ලබන ආකාරය අනුව ප්‍රඥාවේ ප්‍රභේද කීපයක් දක්නට ලැබේ. ඒ අනුව නිදහසේ සිතීමෙන් ලබන ප්‍රඥාව,
1. චින්තාමය ප්‍රඥාවයි.
2. සුතමය ප්‍රඥාවයි.
3. භාවනාමය ප්‍රඥාවයි.
4. අධිගම ප්‍රඥාවයි.
5. පාරමිතාමය ප්‍රඥාවයි.

28. බුදුදහම විස්තර කරන නිදහස් චින්තනයට හොඳ ම මූලාශ්‍රයක් හැටියට කේසපුත්ත නියංගමේ විසූ කාලාමයන්ට දේශනා කළ කාලාම සූත්‍රය පෙන්වාදිය හැකි ය. එහි එන ආකාරයට 'මා ආකාර පරිවිතක්කේන' යන්නෙන් අදහස් කරන්නේ,
1. තර්කයට එකඟ වූ පමණින් නොපිළිගත යුතු ය.
2. න්‍යායට අනුව යමක් නිවැරදියැයි නොපිළිගත යුතු ය.
3. මතුපිට ලක්ෂණ දෙස බලා යමක් නොපිළිගත යුතු ය.
4. පරපුරෙන් පැවත ආ නිසා නිවැරදි යැයි නොපිළිගත යුතු ය.
5. ගුරුවරයා කී නිසා යමක් නිවැරදි යැයි නොපිළිගත යුතු ය.

9. අටමහා පිංකම් අතර උත්තම පිංකමක් ලෙස 'කඨින චීවර පූජාව' සැලකිය හැකි ය. මෙම කඨින චීවරය ගැනීමට හිමිකම් ඇත්තේ,
   1. පසු වස් වසා පවාරණය කළ භික්ෂුවට ය.
   2. පෙර වස් වසා පවාරණය නොකළ භික්ෂුවට ය.
   3. පසු වස් වසා පවාරණය නොකළ භික්ෂුවට ය.
   4. පෙරවස් වසා පවාරණය කළ භික්ෂුවට ය.
   5. පසු වස් සමාදන් වූ භික්ෂුවට ය.

30. අතීත ශ්‍රී ලාංකික රජවරු තම අනුශාසකයා වශයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේ තෝරාපත්කරගෙන ඇති අතර, මහසෙන් රජතුමා තම අනුශාසක භික්ෂුව හැටියට තෝරාගත්තේ,
   1. ගෝදත්ත තෙරුන් ය. 2. සංඝමිත්‍ර තෙරුන් ය. 3. බුද්ධරක්ඛිත තෙරුන් ය.
   4. ධම්ම රුචි තෙරුන් ය. 5. මහාසුධම්ම තෙරුන් ය.

31. ථෙරවාදී ධර්ම සංගායනා තුනක් පවත්වා ඇති බව ශාසන ඉතිහාසයේ දක්නට ලැබෙන අතර, පළමු සංගායනාවෙන් විනය හා සූත්‍ර පිටක සම්පූර්ණ වේ. තුන්වන ධර්ම සංගායනාවෙන් අභිධර්ම පිටකය ද සම්පූර්ණ වෙයි. එහිදී අභිධර්ම පිටකයට එක්කළ කෘතිය වන්නේ,
   1. කථාවත්ථු ප්‍රකරණයයි. 2. ධාතු ප්‍රකරණයයි. 3. යමක ප්‍රකරණයයි.
   4. විභංග ප්‍රකරණයයි 5. පට්ඨාන ප්‍රකරණයයි.

32. පළමු ධර්ම සංගායනාවේදී මහාකාශ්‍යප මහරහතන් වහන්සේ හා ශිෂ්‍ය පිරිසට ආරක්ෂා කිරීම සඳහා භාරදෙන ලද පිටකය වන්නේ,
   1. මජ්ඣිම නිකායයි. 2. දීඝ නිකායයි 3. සංයුක්ත නිකායයි.
   4. අංගුත්තර නිකායයි. 5. ඛුද්දක නිකායයි.

33. ශ්‍රමය යනු පුද්ගලයාගේ කායික හා මානසික ශක්තියයි. අනලස් ව අප්‍රමාදී ව, උත්සාහයෙන් ශ්‍රමය කැපකිරීම තුළින් පුද්ගලයා නිෂ්පාදන කාර්යයෙහි යෙදිය යුතු ය. වස්තුව, ධනය උපයාගැනීමේදී ''දහදිය වගුරුවා, එය රැස්කළයුතු බව විස්තර වන්නේ,
   1. ''උට්ඨාන විරියාධිගතෙහි'' 2. ''බාහු බල පරිචිතෙහි'' 3. ''සේදා වක්ඛිත්තෙහි''
   4. ''ධම්මිකේහි ධම්ම ලද්දේහි'' 5. ''භමරස්සේව ඉරීයතො''

34. සමස්ත බුද්ධ චරිතය පුරා ම උන්වහන්සේගේ සුවිශේෂ ගුණාංග විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන් අතින් අගය කිරීමට ලක්වී ඇත. බුදුරජාණන් වහන්සේ අල්පාහාර වීම, ලද චීවරයෙන් සතුටුවීම, ලද පිණ්ඩපාතයෙන් සතුටුවීම, ලද සෙනසුනෙන් සතුටුවීම, පිරිස්වලින් වෙන්ව නිවන්සුව විඳීමට සතුටුවීම හා ඒවායේ ගුණ ප්‍රකාශ කිරීම නිසා පැහැදීමට ලක් වූ සමකාලිනයෙක් වන්නේ,
   1. සකුළුදායී පරිබ්‍රාජකයා ය. 2. චංකී පරිබ්‍රාජකයා ය 3. පොට්ඨපාද පරිබ්‍රාජකයා ය.
   4. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ය. 5. අස්සලායන බ්‍රාහ්මණයා ය.

35 බුදුරජාණන් වහන්සේ අසමසම ප්‍රඥා මහිමයකින් යුක්ත බව බුද්ධ දේශනා තුළින් ම දැකගත හැකි යි. විවිධ ඥාන දර්ශනයන්ගෙන් ප්‍රභාවිත වූ බුදුරදුන්ට 'ත්‍රිලක්ෂණය පිළිබඳ දැනීම හෙවත් විදර්ශනා ඥානය පැවති බව අම්බට්ඨ සූත්‍රය පෙන්වා දෙයි. ඒ ඥාන දර්ශනය අයත් වන්නේ,
   1. ත්‍රිවිද්‍යාවලට ය. 2. අෂ්ටවිද්‍යාවලට ය. 3. දසබල ඤාණ වලට ය.
   4. සතර මහෝපදේශවලට ය. 5. පසළොස්චරණ ධර්මවලට ය.

36. උරුවේල් දනව්වේ ඉතා ප්‍රකටව විසූ තුන්බෑ ජටිලයෝ හා ඔවුන්ගේ පිරිස බුදුරජාණන් වහන්සේගෙන් දහම් අසා බුදුසසුනට ඇතුළත් වූහ. එම පිරිස රහත් පදවියට පත්වූයේ,
   1. පරිනිබ්බාන සූත්‍රය ඇසීමෙන් ය. 2. බ්‍රහ්මජාල සූත්‍රය ඇසීමෙන් ය.
   3. අරියපරියේෂණ සූත්‍රය ඇසීමෙන් ය. 4. ආදිත්තපරියාය සූත්‍රය ඇසීමෙන් ය.
   5. වීමංසක සූත්‍රය ඇසීමෙන් ය.

37. යුතුකම් හා වගකීම් විස්තර වන සිඟාලෝවාද සූත්‍රයේ සඳහන්වන දකුණු දිසාවෙන් නියෝජනය වන්නේ,
   1. ගුරුවරුන් ය.   2. මහණ බමුණන් ය.   3. දෙමාපියන් ය.
   4. ශිෂ්‍යයන් ය.   5. අඹුදරුවන් ය.

38. මහා ප්‍රජාපතී ගෝතමිය පැවිද්ද ලැබීමෙන් භික්ෂුණී ශාසනය ආරම්භ විය. එම භික්ෂුණී ශාසනයේ විනයධර භික්ෂුණීන් අතර අග තනතුරු ලැබූ තෙරණිය වූයේ,
   1. සකුලා තෙරණියයි.   2. නන්දා තෙරණියයි.   3. ඛේමා තෙරණියයි.
   4. පටාචාර තෙරණියයි.   5. සෝමා තෙරණියයි.

39. නාලන්දා, වික්‍රමශිලා, ජගද්දලා, වලභී යනු භාරතීය විශ්ව විද්‍යාලයන් ය. මෙම විශ්ව විද්‍යාල අතුරෙන් 'වික්‍රමශිලා' විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමේදී පුරෝගාමී වූ තෙරුන් වහන්සේ වන්නේ,
   1. කම්පාල තෙරුන් ය.   2. පාහියං තෙරුන් ය.   3. ධර්මපාල තෙරුන් ය.
   4. අශ්වඝෝෂ තෙරුන් ය   5. නාගාර්ජුන තෙරුන් ය.

40. තෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව නවරට ධර්ම ප්‍රචාරය කළ බව මූලාශ්‍ර සඳහන් කරයි. එහිදී සෝණ, උත්තර යන තෙරවරු වැඩම කළ රට වන්නේ,
   1. මහිස මණ්ඩලයට ය.   2. අපරන්ත දේශයට ය.   3. තම්බපණ්ණියට ය.
   4. සුවර්ණ භූමියට ය.   5. වනවාස දේශයට ය.

41. ගිහි - පැවිදි දෙපිරිසට ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබාදීමේදී භාරතීය බෞද්ධ විශ්ව විද්‍යාල සිදුකළ මෙහෙවර අතිවිශාල ය. මහායාන සම්ප්‍රදායෙන් බැහැරව අධ්‍යාපනය ලබාදුන් විශ්ව විද්‍යාලය නම්,
   1. වලභි විශ්ව විද්‍යාලය යි.   2. වික්‍රමශිලා විශ්ව විද්‍යාලය යි.
   3. නාලන්දා විශ්ව විද්‍යාලය යි.   4. ජගද්දලා විශ්ව විද්‍යාලය යි.
   5. ඕදන්තපුරී විශ්ව විද්‍යාලය යි.

42. කිසියම් පුද්ගලයෙක් නිවැරදි කාය කර්මයෙන්, වචී කර්මයෙන් මනෝකර්මයෙන් යුතුව දිවිගෙවයි නම්, එයින් ලබන සතුට බුදුදහමෙහි හඳුන්වා ඇත්තේ,
   1. අණන සුඛය ලෙස ය.   2. භෝග සුඛය ලෙස ය
   3. සාමිස සුඛය ලෙස ය   4. අනවජ්ජ සුඛය ලෙස ය.
   5. නිබ්බාන සුඛය ලෙස ය.

43. බුදු දහම ලක්දිවට පැමිණීමට පෙර මෙහි විසූවන් විවිධ ආගම්, ඇදහිලි, පුද සිරිත්වලට නැඹුරුව සිටි බව වංශකථා පිරික්සීමෙන් දැකගත හැකි ය. එකල පණ්ඩුකාභය රජු දවස යක්ෂ - යක්ෂණියන් ඇදහීම ඉතා ජනප්‍රිය ව පැවතුනි. පණ්ඩුකාභය රජු අභය වැවේ යට කොටසේ දෙවොලක් ඉදිකර දුන්නේ,
   1. කාලවේල යක්ෂයාට ය.   2. චිත්තරාජ යක්ෂයාට ය.
   3. මහේජ යක්ෂයාට ය.   4. වලවාමුඛී යක්ෂණියට ය.
   5. ජුතින්දර යක්ෂයාට ය.

44. සප්ත අධිකරණ සමථ සහිත ව භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයේ අන්තර්ගත ශික්ෂාපද වනුයේ,
   1. 310 යි.   2. 311 යි.   3. 32 යි.   4. 313 යි.   5. 315 යි.

45. කුසල්, අකුසල් සිදු කිරීමේදී සිත, කය, හා වචනය මූලික වනබව බුද්ධ දේශනාවයි. ඒ අනුව සිතින් සිදුවන අකුසල් අතරට අයත් වන්නේ,
   1. අදත්තාදාන   2. පාණාතිපාතා   3. පේසුඤ්ඤ
   4. සම්පප්පලාප   5. ව්‍යාපාද

46. ''සමග්ගා හෝථ මා විවදථ'' ''මහණෙනි, සමගිවන්න වාද - විවාද නොකරන්න'' යැයි බුදුන් වහන්සේ දෙසුව ද භික්ෂූන් වහන්සේලා කලහ ඇතිකරගත් නිසා, බුදුරජාණන් වහන්සේ තෙමසක් වනගත ව වැඩ සිටි බව බුද්ධ චරිතයෙන් දක්නට ලැබේ. එසේ කලහ ඇතිකරගනු ලැබුවේ,

1. ගයා ශීර්ෂයේ භික්ෂූන් වහන්සේලා ය.
2. උරුවෙල් දනව්වේ භික්ෂූන් වහන්සේලා ය
3. රජගහ නුවර භික්ෂූන් වහන්සේලා ය.
4. වජ්ජි පුත්තක භික්ෂූන් වහන්සේලා ය.
5. ඝෝෂිතාරාමයේ භික්ෂූන් වහන්සේලා ය

47. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට නොබෝ දිනකින් ම දහස් සංඛ්‍යාත පිරිස් බුදු සමය වැළඳගත් බව දක්නට ලැබෙන අතර, මිහිඳු හිමි ''ඇත්හළේදී කළ ධර්ම දේශනාව අසා දහසක් පිරිස සෝවාන් වූ බව සඳහන් වේ. මෙහිදී දේශනා කරනු ලැබූ සූත්‍රය නම්,

1. දේවදූත සූත්‍රය
2. චූල්ලහත්ථිපදෝපම සූත්‍රය.
3. සාරෝපම සූත්‍රය.
4. සච්ච සංයුත්ත සූත්‍රය
5. කාලාම සූත්‍රය

48. ලක්දිව නිර්මල ථෙරවාදී බුදුසමය වලගම්බා රජ දවස දක්වා නිරුපද්‍රිත ව පවත්වා ගැනීමට හැකිවිය. එහෙත් විටින් විට ඇති වූ ශාසනික විලෝපයන් නිසා විවිධ අභියෝගවලට බුදු සමයට මුහුණ දීමට සිදුවිය. ඒ අනුව ප්‍රථමවරට වෛතුල්‍යවාදී මත බුදු සමයට ඇතුළත් වීම,

1. ගෝඨාභය රජ දවස සිදු විය.
2. වෝහාරික රජ දවස සිදුවිය.
3. මහසෙන් රජ දවස සිදු විය.
4. ජෙට්ඨතිස්ස රජ දවස සිදුවිය.
5. එළාර රජ දවස සිදුවිය.

49. පණ්ඩුකාභය රජ දවස ශ්‍රී ලංකාවේ පූජනීයත්වයට පත්වෙමින් වන්දනා කරනු ලැබූ වෘක්ෂ දෙකක් වන්නේ,

1. නුග ගස හා බෝ ගසයි.
2. තල් ගස හා නුග ගසයි.
3. බෝ ගස හා නා ගසයි.
4. තල් ගස හා බෝ ගසයි.
5. නුග ගස හා නා ගසයි.

50. අභයගිරියට අයත් ''රත්නප්‍රාසාදය' නම් ගොඩනැගිල්ල කනිට්ඨතිස්ස රජු විසින් ඉදිකරවා පූජා කරනු ලැබුවේ,

1. කුපික්කල මහාතිස්ස තෙරුන්ට ය.
2. සංඝමිත්‍ර තෙරුන්ට ය.
3. මහානාග තෙරුන්ට ය.
4. බිහලමස්සුතිස්ස තෙරුන්ට ය.
5. කොහොන්තිස්ස තෙරුන්ට ය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

45 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ..............................   බෞද්ධ ශිෂ්ටාචාරය II   කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

01. (i) වෛශ්‍ය වර්ණයට හිමි ස්වධර්මය නිවැරදි ව නම් කරන්න.
    (ii) බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළ බමුණන් ආගමික හා අධ්‍යාපනික ආධිපත්‍යය හිමිකරගෙන තිබුණේදැයි පෙන්වා දෙන්න.
    (iii) වෛදික සමාජ පසුබිම තුළ කාන්තාව පුරුෂාධිපත්‍යයට නතු කරගෙන ක්‍රියා කළ ආකාරය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න.
    (iv) වර්ණ ධර්ම බැහැර කිරීමට බුදු සමය ඉදිරිපත් කළ සාධක දෙකක් ගෙනහැර දක්වන්න.
    (v) විවිධ අර්ථ සිද්ධීන් සඳහා බමුණන් විසින් නියම කරනු ලැබූ යාග විධි පිළිබඳ හැඳින්වීමක් කරන්න.

02. (i) බුදුසිරිතේ එන ''තාදී'' ගුණය නිදසුන් මගින් පැහැදිලි කරන්න.
    (ii) අනුගාමිකයන් හික්මවීමෙහිලා බුදුරදුන් තුළ පැවති උපාය කෞශල්‍යය ඥානය පිළිබිඹුවන අවස්ථා දෙකක් නිදසුන් කොට දක්වන්න.
    (iii) බුදුරදුන්ගේ ධර්ම දේශනා තුළ විද්‍යමාන විවිධත්වය කෙටියෙන් පැහැදිළි කරන්න.
    (iv) ආගමික සහනශීලීත්වය බුදු සිරිතේ ප්‍රකට වන අයුරු නිදසුන් දෙකක් ඇසුරින් අගයන්න.
    (v) බෞද්ධ උපසම්පදාවේ ආරම්භය හා විකාශනය කෙටියෙන් පහදන්න.

03. (i) අශෝක අධිරාජයා බෞද්ධයෙකු බව සනාථ කිරීමට නිදසුන් හතරක් ඉදිරිපත් කරන්න.
    (ii) පැරණි භාරතීය විශ්ව විද්‍යාලවල ශ්‍රී විභූතිය ප්‍රකට කෙරෙන බෞද්ධ විද්‍යාස්ථානයක් ලෙස නාලන්දාව ඇගයීමට ලක්කරන්න.
    (iii) මිහිඳු හිමි ලක්දිව බුදු සසුන පිහිට වූ අයුරු දක්වන්න.
    (iv) අශෝක දහමේ එන විශ්ව සාධාරණ ඉගැන්වීම් ඇත්දැයි පරික්ෂා කරන්න.
    (v) දැහැමි රාජ්‍ය පාලනයකට අදාළ බෞද්ධ ඉගැන්වීම් නම් කරන්න.

## II කොටස
### මෙම කොටසින් ප්‍රශ්න තුනක් තෝරා පිළිතුරු ලියන්න.

04. (i) සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරු - ශිෂ්‍ය වගකීම් හා යුතුකම් නම් කරන්න.
(ii) වත්මන් සමාජ ගැටලු නිරාකරණය කරගැනීමට ගුරු - ශිෂ්‍ය සම්බන්ධතාවයේ අදාළත්වය පැහැදිලි කරන්න.
(iii) කල්‍යාණ මිත්තතාව පිළිබඳ සූත්‍රානුසාර විවරණයක යෙදෙන්න.
(iv) බුදුසමයේ දක්වෙන පුද්ගල ස්වාමිත්වය ප්‍රගතිශීලී සමාජයක් බිහිකිරීමට ඉවහල්වන අයුරු පෙන්වා දෙන්න.

05. (i) සාමකාමී යහපත් සමාජ වටපිටාවක් ගොඩනගා ගැනීමට පඤ්චශීල ප්‍රතිපදාවේ අදාළත්වය පැහැදිලි කරන්න.
(ii) බුදු දහමෙන් උගන්වන අල්පේච්ඡතාව අධිගමලාභයට යම් මඟපෙන්වීමක් කරන්නේදැයි පෙන්වා දෙන්න.
(iii) ''විමුක්තිගාමී මාවතේ මුල් ම පියවර ශ්‍රද්ධාවයි'' පහදන්න.
(iv) ගිහි සැපය, ජීවන ගැටලු විසඳ ගැනීමට මඟ පෙන්වීමක් සිදුකරන්නේදැයි විමර්ශනය කරන්න.

06. (i) බුද්ධකාලීන ව භාරතය තුළ බුදුදහම සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම සඳහා රජවරුන්ගෙන් ලැබුණ අනුග්‍රහය උදාහරණ මගින් පැහැදිලි කරන්න.
(ii) බුදු සසුනේ චිර පැවැත්ම වෙනුවෙන් පළමු ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණ ඉවහල් වූ ආකාරය පෙන්වා දෙන්න.
(iii) ''ථෙරවාදී බුදු දහමේ කේන්ද්‍රස්ථානය මහා විහාරයයි.'' එයින් ශාසනයට සිදු වූ මෙහෙවර අගයන්න.
(iv) ලාංකික භික්ෂුව හා රජය අතර පැවති සබඳතාව ඇගයුමට ලක්කරන්න.

07. (i) ''දැහැමි ධනෝත්පාදනය බුදු සමය අගය කරයි.'' බෞද්ධ සූත්‍රානුසාරයෙන් කරුණු ගෙනහැර දක්වන්න.
(ii) ධන පරිහරණයට බුදු සමයෙන් යම් මඟ පෙන්වීමක් කර ඇත්දැයි පිරික්සන්න.
(iii) සුබනම්‍ය සමාජ වටපිටාවක් විෂයෙහි සම්පත් කළමනාකරණයේ ප්‍රායෝගික වටිනාකම ඇගයීමට ලක්කරන්න.
(iv) සුරක්ෂිත භෞතික පරිසරයකට බුදුදහමෙන් ලැබෙන අනුබලය විමසන්න.

08. (i) හොඳ නරක වෙන්කර ගත හැකි බෞද්ධ නිර්ණායක ඇගයුමට ලක් කරන්න.
(ii) ''සෞන්දර්ය රසාස්වාදයට බුදු දහමින් බාධාවක් නැත'' විමසන්න.
(iii) ප්‍රාග්මහින්ද යුගයේ බ්‍රාහ්මණ ආගම මෙරට මුල්බැසගෙන තිබූ ආකාරය පෙන්වා දෙන්න.
(iv) ශ්‍රී ලාංකීය ථෙරවාදී බුදු දහමට එල්ල වූ අභියෝග ගෙනහැර දක්වන්න.

# දෙවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය - බෞද්ධ ශිෂ්ටාචාරය - පිළිතුරු
## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **11.** - 1 | **21.** - 4 | **31.** - 1 | **41.** - 1 |
| **02.** - 5 | **12.** - 2 | **22.** - 5 | **32.** - 3 | **42.** - 4 |
| **03.** - 1 | **13.** - 3 | **23.** - 2 | **33.** - 3 | **43.** - 2 |
| **04.** - 2 | **14.** - 1 | **24.** - 2 | **34.** - 1 | **44.** - 2 |
| **05.** - 4 | **15.** - 3 | **25.** - 4 | **35.** - 2 | **45.** - 5 |
| **06.** - 2 | **16.** - 2 | **26.** - 5 | **36.** - 4 | **46.** - 5 |
| **07.** - 5 | **17.** - 2 | **27.** - 1 | **37.** - 1 | **47.** - 1 |
| **08.** - 1 | **18.** - 2 | **28.** - 3 | **38.** - 4 | **48.** - 2 |
| **09.** - 4 | **19.** - 4 | **29.** - 4 | **39.** - 1 | **49.** - 2 |
| **10.** - 5 | **20.** - 3 | **30.** - 2 | **40.** - 4 | **50.** - 3 |

# දෙවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය - බෞද්ධ ශිෂ්ටාචාරය - පිළිතුරු
## II පත්‍රය
## I කොටස

01. (i) පශූනං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යන මේව ච,
වණික්පථං කුසීදං ච - වෛශ්‍යෂ්‍ය කෘෂි මේව ච (මනු : 1 - 90)
පශු පාලනය, දන් දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළඳම, මුදල් පොලියට දීම, කෘෂි කර්මාන්තය යන කරුණු වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම වේ.

(ii) ''අධ්‍යාපන මධ්‍යයනං - යජනං යාජනං තථා - දානං ප්‍රතිග්‍රහණං චෛව - බ්‍රාහ්මණාන මකල්පයක්''
ඉගෙනීම හෙවත් අධ්‍යයනය, ඉගැන්වීම හෙවත් අධ්‍යාපනය යන අංශ කෙරෙන් අධ්‍යාපනයේ ආධිපත්‍යය ලබා ඇත. ඉගෙනීමේ වැඩිකාලයක් සිප්හලේ බමුණු කුමරා ගත කිරීමෙන් අන් අයට වඩා අධ්‍යාපනයෙන් පෙරට එයි. යාග කිරීම හෙවත් යජනය, යාග කරවීම හෙවත් යාජනය, පරිත්‍යාගය හෙවත් දානය, දානය පිළිගැනීම හෙවත් ප්‍රතිග්‍රහණය යන අංශ කෙරෙන් ආගමික ආධිපත්‍ය ලබා ඇත. ඉහත ක්‍රියාකාරකම්වලට බමුණාගේ අත්‍යවශ්‍ය සහභාගිත්වය නිසා ආගමික ආධිපත්‍ය ලබයි.

(iii) බාල්‍යෙ පිතුර් වශේ තිෂ්ඨේත් - පාණි ග්‍රාහස්‍ය යෞවනේ, පුත්‍රාණං භර්තරී ප්‍රේතේ
* කාන්තාව බාල කාලයේ පියා ද, තරුණ කාලයේ ස්වාමියා ද, මහලු කාලයේ පුත්‍රයාද ඇය රක්ෂා කළ යුතු ය. ස්වතන්ත්‍රව හැසිරීමට ඉඩ නොදිය යුතුය.
* හිතෝපදේශයේ දේශයේ 129 වන ශ්ලෝකයෙන්ද එම අදහස තහවුරු වේ.
'පිතා රක්ෂති කෞමාරේ -භාර්යා රක්ෂති යෞවනේ, රක්ෂන්ති ස්ථවිරේ පුත්‍රාඃ - නා ස්ත්‍රී ස්වතන්ත්‍රමර්හතේ'
* ආර්ථික සාමාජික අධ්‍යාපනික ආර්ථික වරප්‍රසාද ඇයට අහිමි විය.
* ආගම ඇදහීම, යාගවලට සම්බන්ධ වීම තහනම්ය.
* සති පූජාවෙන් ජීවත්වීමේ අයිතිය නැතිකර ඇත.
* විවාහයේදී කැමති අයකු තෝරාගැනීමට නිදහස නැත. දේපළ හෝ ධන අයිතිය නැත.

(iv) ජීව විද්‍යාත්මක සාධක - වාසෙට්ඨ සූත්‍රය, සමාජ විද්‍යාත්මක සාධක - මධුර අස්සලායන සූත්‍රය
ආචාර විද්‍යාත්මක සාධක - වසල සූත්‍රය, ඓතිහාසික සාධක - යෝණ, කාම්බෝජ දෙරට තුළ නොපැවතීම, වාසභ ඛත්තියාගේ විවාහය. ආර්ථික, නෛතික ආදී සාධක ඇසුරෙන් 2ක් විස්තර කිරීම ප්‍රමාණවත්ය.

(v) * මෙලොව ජීවිතය සැපවත් කර ගැනීමත් මරණින් පසු බ්‍රහ්ම සහව්‍යතාවට පත්වීමත් යාගයේ ප්‍රධාන අරමුණ වේ. * අස්වැන්න සරුකර ගැනීම, දේපොළ ලැබීම, සතුරු උවදුරු නැති කිරීම, අපල දුරු කිරීම, යුධ ජය, දරු සම්පත් ලබාදීමාදිය ද යාග කිරීමේ තවත් අරමුණු වේ.
* අශ්වමේධ, පුරුෂමේධ, වාජපේය, නිරග්ගල, සම්මාපාස රාජසූය, සර්වමේධ, පංචතික සත්ත සතික සාහසිකාදීයෙන් කීපයක් යාග පිළිබඳ ප්‍රමාණවත් පිළිතුරක් අවශ්‍ය වේ.

02. (i) නොසැලෙන ගුණයයි. ''ලාභෝ අලාභෝ අයසෝ යසො ච -නින්දා ප්‍රසංසා ච සුඛං ච දුක්ඛං''
අටලෝ දහමට කම්පා නොවීම, ලාභ - අලාභ - යස - අයස - නින්දා - ප්‍රසංසා -සැප - දුක් යන තන්හිදී මැදිහත්ව කටයුතු කිරීමයි.
* වේරංජාවේ වස් විසීම. දානය නැතිවීම. වෙහෙර විහාර - දන් පැන් - ජීව අජීව සම්පත් ලැබීමේදී උද්දාම නොවීම.
* යසස, ප්‍රසංසාවලදී ද උද්දාම නොවීම.
* නින්දා කිරීම - මාගන්ධියා, සුන්දරීගේ මරණය කම්පාවට පත්නොවී මැදිහත්ව ක්‍රියාකළ ආකාරය විස්තර කිරීම ප්‍රමාණවත් වේ.

(ii) * උපාය කුසලතාව බුදුන් සතුව පැවති සුවිශේෂ හැකියාවකි.
* සුදුසු මාර්ගයෙහි දක්ෂතාවයෙන් යුතු ඤාණය
ඛේමා - නන්දා -කිසාගෝතමී වැනි අයට පවා තත්වය ලබාදුන්නේ උපාය කෞශල්‍යතා ඤාණයෙනි. මින් අවස්ථා 2ක් මතුකරගෙන විස්තර කිරීම ප්‍රමාණවත් වේ.

(iii) * එකම උපමාව, නිදසුන තෝරා ගන්නේ නැතිව ශ්‍රාවකයාගේ මානසික තත්ව මැනවින් දැන ධර්ම දේශනා කිරීම.
* ධර්ම දේශනා කිරීමේදී ජාති, ආගම්, කුල, ගෝත්‍ර, උස්, පහත් භේද නොසලකා පුද්ගල චරිත හඳුනාගෙන දම් දෙසීම.
* දේශනා මාධ්‍ය ලෙස නොගැඹුරු සරල, භාෂාව යොදා ගැනීම.
දානකථා- සීලකථා ආදියෙන් පටන්ගෙන අනුපුබ්බී කථා ශ්‍රාවකසිත් ධර්මාවබෝධවත් කරවන සාමුක්කංසික ක්‍රමය.

ඍජු දේශනා - ධම්ම චක්කපවත්වන දේශනාව
සාකච්ඡා - කන්දරක සූත්‍රය
උපමානුසාරී දේශනා - රාහුලෝවාද සූත්‍රය
පැවරුම් - චුල්ලපන්තක, කිසාගෝතමී
අත්තජ්ඣාසය - තමන් වහන්සේගේ අදහස් අනුව
පරජ්ඣාසය - ශ්‍රාවක අපේක්ෂාව අනුව
අට්ඨුප්පත්තික - එලඹි කරුණු පදනම් කරගෙන
පුච්ඡාවසික - ප්‍රශ්නයකට පිළිතුරුදීම
ඒකංස ව්‍යාකරණ - ඍජු පිළිතුරු දීම
විභජ්ජ ව්‍යාකරණ - විග්‍රහකොට කියාදීම
පටිපුච්ඡා ව්‍යාකරණ - ප්‍රතිප්‍රශ්න නගා පිළිතුරු දීම
ඨපනීය - පසෙකින්තැබීම
දෘශ්‍යාධාර භාවිතය     ආදී ක්‍රම බුදුන්ගේ දේශනා විචිත්‍රත්වයට පත්කර වන්නට හේතු විය.

(iv) * බුදු රජාණන් වහන්සේ අන්‍යාගමික ආරාමවලට වැඩම කර ධර්මදේශනා කිරීම - සාකච්ඡා කිරීම.
උදා : පොට්ඨපාද - සන්දක - සකුළුදායී  වැනි අය භාවිතා කළ සාකච්ඡා
* අන්‍යාගමිකයින් වාදවිවාදවලට පැමිණි කළ මෛත්‍රියෙන් කරුණු පෙන්වාදීම.
* බහු ආගමික සමාජයක සුහදව හා විචාරශීලී ව ජීවත්වීම පිළිබඳ ව
උදාහරණ ලෙස කාලාමවරු - උපාලි ගෘහපතියා - අභය රාජ කුමාරයා
* අන්‍ය ආගමික පිරිස් මගින් කරුණු පෙන්වාදීම.

(v) * බෞද්ධ උපසම්පදාව පස්වග මහණුන්ගෙන් ආරම්භ වූ බව.
* උපසම්පදා යන්නෙන් අධිශීලයට පත්වීම, සාමණේරත්වයෙන් ඔසවා තැබීම ආදි අරුත් කියවෙන බව
* ප්‍රථම උපසම්පදා ක්‍රමය 'ඒහි භික්ඛු' උපසම්පදාවයි. ඕවාද පටිග්ගණ, ඤත්තිචතුත්ථකම්ම, සරණාගමනාදී උපසම්පදා ක්‍රම ඇති බව.
* උපසම්පදා විනය කර්ම තුළින් ශාසනික සුරක්ෂිතතාවට ප්‍රබල ශක්තියක් බව.
* ''විනයෝ නාම සාසනස්ස ආයු...'' යන්නෙන් ඒ බව ප්‍රකට වන බව.

03. (i) තුන්වැනි සංගායනාවට අනුග්‍රහ දැක්වීම. දුව - සංඝමිත්තා. පුතා - මිහිඳු සසුනට පූජා කිරීම.
* කාලිංග යුද්ධය නසා කලකිරුණු අශෝක නිග්‍රෝධ හිමිගෙන් දම් අසා බුදු දහම වැළඳ ගැනීම - (මහා වංශය)
* හියුංසාන්ට අනුව - අශෝක බෞද්ධයෙකු වූයේ උපගුප්ත තෙරුන්ගෙන් දම් අසාය.
''මහරජ රට ලේ විලක් බවට පත්කර ලබන ජය ජය නොවේ. ධර්ම විජයෙන් ලබන ජය ජය ම වන්නේ ය'' ආදී දහම් අනුසාසනාව අසා පැහැදී බෞද්ධයෙකු වී ඇත.
* ධර්මාශෝක විසින් චක්කවත්තී සීහනාද සූත්‍රයට අනුව රජෙකු පිළිපැදිය යුතු ධර්ම පිළිපැදීම.
* බෞද්ධයෙකු විසින් වැඳපුදා පහන් සංවේගය උපදවාගතයුතු ස්ථාන වන්දනා කිරීම.
* අශෝකගේ සෙල්ලිපි ඔහු බෞද්ධයෙකු බව සනාථ කරයි. ඔහු තෙරුවන් සරණ ගිය බව බයිරාට් ලිපිය සාක්ෂි දරයි. ''සක්කමුනී බුද්ධස භගවා සරණං ගතේ (බයිරාට්)
* මා ශාක්‍ය මුනීන්ද්‍රයාණන්ගේ අනුගාමිකයෙකු වී වර්ෂ දෙක හමාරකට පසු සංඝයා වෙත එළඹ වර්ෂයකට වැඩිය මම වැඩි දියුණුවට පත්වීමි. (මස්කි - බ්‍රහ්මගිරි - රූපනාථ)
* බාබ්‍රෑ ලිපියෙන් අශෝක සංඝයා කෙරෙහි තිබූ ශ්‍රද්ධාව පෙන්වයි.
* විනය සමුකස, අරිය වස, අනාගතභය, මුනිගාථා - මොනෙය්‍ය සූත්‍රය, උපතිස පසින රාහුලෝවාද යන ධර්මගත් භික්ෂු භික්ෂුණින් විසින් මතක තබාගත යුතු බව (බයිරාට්)
* අශෝක බුදු දහම රාජ්‍ය ආගම බවට පත් කිරීමෙන්ම තමා බෞද්ධයෙකු බව පෙන්වා ඇත.
* සසුන පිරිසිදු කිරීම - දුසිල් මහණුන් ඉවත්කිරීම - ධර්ම ප්‍රචාරණයට සහභාගිවීම වැනි කරුණු ඇසුරින් පිළිතුර සැකසීම ප්‍රමාණවත්.

(ii) * ක්‍රි.ව. 415 - 455 රජ කළ ශක්‍රාදිත්‍ය හෙවත් කුමාරගුප්ත රජ නාලන්දාව ආරම්භ කළ බව.
* මෙහි සංවර්ධනය සඳහා බුද්ධ ගුප්ත, තථාගත ගුප්ත, බාලාදිත්‍ය වැනි රජවරු දායක වූ බව.
* නේවාසික ශිෂයයන් 10000 ක් සිටි බව.
* ආචාර්ය මණ්ඩලය 1500 ක්ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය 1500 ක්ද සිටි බව.
* භාෂාධ්‍යයන විෂය ධාරාව, දර්ශණ අධ්‍යයන විෂය ධාරාව බුද්ධ ධර්ම අධ්‍යයන විෂය ධාරාව, ලෞකික අධ්‍යයන විෂය ධාරාව, ලලිත කලා අධ්‍යයන විෂය ධාරාව යනුවෙන් විෂයධාරා 05ක් පැවති බව.
* ඉගෙනුම් ක්‍රම ලෙස දේශනා ක්‍රමය, විවාද ක්‍රමය, පෞද්ගලික සාකච්ඡා ක්‍රමය භාවිතයට ගත් බව.
* ප්‍රධාන පුස්තකාලය ගොඩනැගිලි 03ක් පැවැති බව.

(iii) * 3 වන සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස දහම මිහිඳු හිමි රැගෙන ඒම.
* දේවානම්පියතිස්ස පිරිස හඳුනාගෙන චුල්ලහත්ථි පදෝපම සූත්‍රය අසා තෙරුවන් සරණ යෑම, (සමණා මයං මහා රාජ.)
* රජ දහම වැළඳ ගැනීම, අනුග්‍රහ දැක්වීම, අනෙකුත් රාජකීයන් දහමට නැඹුරුවීම.
* රජුගේ ආරාධනයෙන් මාලිගාවට පැමිණ, විමාන වත්‍ථු, පේත වත්‍ථු සච්ච සංයුත්ත වැනි දේශනා පැවැත්වීම.
* අනුලා ඇතුළු 500 ක් කාන්තාවන් දහම් අසා සෝවාන් වීම.
* සංඝමිත්තා බෝධි ආගමනය.
* දේවානම්පියතිස්ස රජ මහමෙව්නාව සසුනට පිදීම.
* උපෝසථාගාර ඉදිවීම, අරිට්ඨ ඇතුළු රාජකීයන්ගේ පැවිද්ද.
* ලාංකික භික්ෂූන්ගේ වස් විසීම - ථූපාරාමය ඉදිවීම (අකුධාතු වහන්සේ තැන්පත් කිරීම)
යන කරුනු පසුබිම් කරගෙන මෙරට සසුන පිහිටවූ ආකාරය දැක්වීම.

(iv) ජාති, ආගම්, කුල භේදයකින් තොර ව සැමට පිළිගතහැකි දහමක් හඳුන්වාදීම.
* තුන් කාලයට ගැළපෙන සර්ව කාලීන අගයන් එම ඉගැන්වීම තුළ අන්තර්ගත වීම.
* ඕනෑම සමාජ සංස්ථාවකට එය අදාළ වීම.
* පාලකයින්ට දී ඇති උපදෙස් ප්‍රජාතාන්ත්‍රීය වීම.
* පණ ඇති කිසිදු සතෙකු මරා යාග නොපැවැත්විය යුතු ය.
* රජ මැදුරේ පවා සතුන් මැරීම නතර කිරීම.
* සතුන් මැරීම තහනම් කිරීම. * මිනිසුන්ට හා තිරිසනුන්ට රෝහල් ඉදිකිරීම (මනුවිකිත්සා - පසු විකිත්සා)
* ළිං පොකුණු මංමාවත් තැනීම.
* සියලු ලෝකයාගේ සිත වැඩ සැලසීම මට අයත් කටයුත්තක් කොට සලකමි.
* ධර්ම යාත්‍රා පැවැත්වීම. * සියලු මිනිසුන් මගේ දරුවෝය.

(v) * පඤ්ච සීල ප්‍රතිපදාව * සතර සංග්‍රහ වස්තු * සතර බ්‍රහ්ම විහරණ
* දස රාජ ධර්ම * අපරිහානීය ධර්ම * දස සක්විති වත්
ආදී ඉගැන්වීම් නම් කිරීම ප්‍රමාණවත් ය.

04. (i)

| ගුරුවරුන්ගෙන් | සිසුන්ගෙන් |
|---|---|
| 1. මැනවින් හික්මවීම | 1. ගුරුතුමා දුටුවිට හුනස්නෙන් නැගිටීම. |
| 2. මැනවින් ශිල්ප ලබාදීම. | 2. උපස්ථාන කිරීම. |
| 3. සියලු ශිල්ප ඉගැන්වීම | 3. උපදෙස් පිළිපැදීම. |
| 4. හිතමිතුරන්ට හඳුන්වාදීම | 4. අවශ්‍ය කටයුතු කරදීම. |
| 5. රැකවරණය සැලසීම | 5. මැනවින් ඉගෙනීම. |

(ii) වත්මන් සමාජය තුළ ආර්ථික - දේශපාලනික - ආගමික - සාමාජික ගැටලු නිර්මාණය වී ඇත.
* රටකට අයත් පාලකයන් - දාර්ශනිකයන් - පඬිවරුන් - ඉංජිනේරුවන්- වෛද්‍යවරුන් - කාර්මික ශිල්පීන් - ව්‍යවසායකයින් බිහිකරගන්නේ ගුරුවරු ය.
* ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට හොඳ අධ්‍යාපනයක් දීම තුළ අර්බුධ - ගැටුම් කලකෝලාහල අවම කරගත හැකි ය.
* සුරාව - දූෂණය - දිළිඳුකම - අසහනය - පිටු දැක ක්‍රියා කිරීමට පෙළඹෙයි.
* ජාති - ආගම් - කුල වැනි බෙදීම්වලින් බැහැර වෙයි.
* ආගමික ගැටලු බැහැර කර සහජීවනය ගොඩ නගයි.

(iii) ''මිත්තස්ස සභාවෝ මෙත්තා,'' මිත්‍රයාගේ ස්වභාවය මෛත්‍රිය කිරීමයි.
* ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ (අ.නි.)
ව්‍යග්ගපජ්ජ මේ ලෝකයේ කුල පුත්‍රයෙක් පැමිණ - නියම් ගමක ගෘහපතියෙක් - ගෘහපති පුත්‍රයෙක්, තරුණ හෝ මහලු කවරකු ශ්‍රද්ධා - සීල - ත්‍යාග ප්‍රඥා සම්පන්න වේද ඒ අය සමග එක්ව සිටීද කථා කරයිද සාකච්ඡා කරයිද,

| | |
|---|---|
| ශ්‍රද්ධා සම්පන්නයන් | ශ්‍රද්ධා සම්පත්තිය ද |
| සීල සම්පන්නයන් | සීල සම්පත්තිය ද |
| ත්‍යාග සම්පන්නයන් | ත්‍යාග සම්පත්තිය ද |
| ප්‍රඥා සම්පන්නයන් | ප්‍රඥා සම්පත්තිය ද අනුව හික්මවයි. |

මෙය කල්‍යාණ මිත්‍රත්වයයි.
* සිගාලෝවාද සූත්‍රයේ කෙරෙන කල්‍යාණ මිත්‍රවිවරණ
උපකාරක - අනුකම්පක - අත්ථක්ඛායී - සමාන සුඛ දුක්ඛ
* ධම්ම පදයෙන් කල්‍යාණ මිත්‍රත්වය අගයකර ඇති අයුරු
''භජේථ මිත්තේ කල්‍යාණේ - භජේථ පුරිසුත්තමේ''
* කෝසල සංයුත්තයේ කල්‍යාණ මිත්ත සූත්‍රයට අනුව මුළු බුදු සසුන ම කල්‍යාණ මිත්‍රත්වය මත රඳ පවතින බව දේශනා කර ඇත.

(iv) * සර්වබලධාරියෙකුගේ මැවීම, ගැලවුම්කරු විමුක්තිදායක ආදී දේව සංකල්ප පිළිගන්නා ආගම්තුළින් ප්‍රගතිශීලී චින්තනයට බාධා පමුණුවා ඇති බව.
* කාලාම සූත්‍රය, විමංසක සූත්‍රය, නිබ්බේධික සූත්‍රයේ සඳහන් ආරම්භක ධාතු නික්ඛමධාතු, පරක්කමධාතු.. ආදී ඉගැන්වීම් තුළින් ප්‍රගතිශීලී අදහස්වලට අනුබල දී ඇති බව.
* ''අත්තාහි අත්තනෝ නාථෝ...'' ''අත්තදීපා භික්ඛවේ විහරථ..''
''තුම්හෙහි කිච්චං ආතප්පං...'' ''සුද්ධි අසුද්ධි පච්චත්තං...'' යනාදී ඉගැන්වීම් තුළින් ද බුදුසමය පුද්ගල ස්වාධීනත්වයට අනුබල දී ඇති බව.

05. (i) සමාජය නිවැරදිව පඤ්ච සීල ප්‍රතිපදාව රකියි නම් එයම සමකාමී සමාජයට මග කියයි.
* පළමු සිකපදය - හැම දෙනාගේ ම ජීවිත අගය කිරීම, වටිනාකම් දීම හා ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම.
* දෙවන සිකපදය - දේපොළ සුරක්ෂිත බව තහවුරු කර ඇත.
* තෙවනසික පදය - විවාහ සංස්ථාවේ අභේදනීයත්වය තහවුරු කරයි.
* සිව්වැනි සිකපදය - වචනයේ විශ්වසනීයත්වය ආරක්ෂා කරයි.
* පස්වන සිකපදය - දුසිරිත් - දුරාචාර නැති යහපත් සමාජ පසුබිමක් නිර්මාණය කරන අයුරු විස්තර කරන්න.

(ii) අල්පේච්ඡතාව යනු මහිච්ඡතාවයේ විරුද්ධ පදයයි. විශාල වූ බොහෝ අපේක්ෂා ප්‍රාර්ථනා තබා නොගැනීම මින් අදහස් කෙරේ.
* පුද්ගල අපේක්ෂා හා ආශාවන්ගේ සීමා නැත. (නකහාපන වස්සේන තිත්ති කාමේසු විජ්ජති) ධනකාමියා කහවණු වැස්සක් වැස්සත් ඉන් තෘප්තිමත් නොවේ.
* අල්පේච්ඡතාව පුරුදු කළ කෙනා අසීමිත ආශා පසුපස හඹානොයයි. සමාජයට අහිතකරදේ සිදු නොකරයි.
* අල්පේච්ඡතාව නිසා මානසික දුර්ගුණ - අධිචිත්තවේග අවම වේ.
* ඔහු පහසුවෙන් පෝෂණය කළ හැකි ය. ලද දෙයින් සතුටු වේ. සැහැල්ලු දිවිපැවැත්ම පුරුදු කරයි.
* සාමකාමී තෘප්තිමත් ජීවිතයක් පවත්වා ගනියි.
* අධාර්මික රැකියා නොකරයි. ඔහුන් සමාජයට හිතකර දේ සිදුකරයි.
* මේ ආකාරයෙන් දිවිය නිවන් මඟට යොමු කිරීමට පහසුවන අයුරු දැක්වීම ප්‍රමාණවත්.

(iii) ශ්‍රද්ධාව අමූලිකා - ආකාරවතී යනුවෙන් කොටස් දෙකක් යටතේ විස්තර කරයි.
1. අමූලිකා - පදනම් විරහිත පැහැදීම. 2. ආකාරවතී -විචාරශීලී පැහැදීම.
* සද්ධා බීජං තපෝ වුට්ඨි'' - ශ්‍රද්ධා නැමැති බීජ වපුල කළ නිවන නැමැති අමා අස්වැන්න නෙලා ගැනීමට යන මාවතේ මුල්පියවර ශ්‍රද්ධාවයි.
* චංකි සූත්‍රය / කීටාගිරි / සූත්‍රවල ශ්‍රද්ධාව විස්තර කරමින්,
* ශ්‍රද්ධාව නිසා කෙනෙකු ශාස්තෘවරයා වෙත එළඹෙයි.
* එළඹ ආශ්‍රය කරන බවත්, කියන දේට කන් යොමුකරන බවත් කන් යොමා දම් අසන බවත් ඇසූධර්මය සිතේ ධාරණය කරන බවත් සිතට ගත් ධර්මය පරීක්ෂා කරන බවත් එය තේරුම්ගෙන එයට ප්‍රිය කරන බවත් එමනිසා කැමැත්තක් ඇතිවන බවත් කැමැත්ත නිසා පිළිපැදීමට උත්සාහ කරන බවත් එම උත්සාහයෙන් සත්‍ය අවබෝධ කරගන්නා බවත් ඉහත මූලාශ්‍ර වලින් පෙන්වයි.
* යමෙක් ධර්මය අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ද ඔහු ඒ ශ්‍රද්ධා ප්‍රතිලාභයෙන් යුක්ත වේ.
* ශ්‍රද්ධාව පදනමයි - ශ්‍රද්ධාවෙන් සීලයද - සීලයෙන් ත්‍යාගය ද - ත්‍යාගයෙන් ප්‍රඥාව ද ඇතිවේ.
* විද්‍යාඥයා සත්‍යෙක්ෂණය කරනතුරු තාවකාලිකව පිළිගන්නා උපන්‍යාසය ඇති කරගනී. එමෙන් ම ශ්‍රාවකයා නිවන් අවබෝධ කරගන්නා තුරු ශ්‍රද්ධාව ඇතිකර ගනී. ඉන්පසු අත්හරී.
* ඒ අනුව ශ්‍රද්ධාව සත්‍යාවබෝධයේ මූලික පියවර ලෙස දැක්විය හැකි ය.

(iv) * අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අනණ සූත්‍රයේ දැක්වෙන ගිහි සැප 04 පිළිබඳ ව ප්‍රමාණවත් විවරණයක් සිදුකොට දෛනික ජීවන ගැටළු විසඳගැනීමට ඉවහල් වන අයුරු පෙන්වා දී තිබිය යුතු ය.
* දිළිඳුබව නිසා ණය බරින් පීඩාවීම, අධාර්මික ධනෝපායන ක්‍රම මගින් ඉපයීම, අතෘප්තිකර ආශාවන් පසුපස හඹා යෑම සාහසික සම්පත් පරිභෝජනාදී ජීවන ගැටලුවලට චතුර්විධ සුඛය ඉවහල්වන අයුරු විචාරාත්මකව පෙන්වාදීම ප්‍රමාණවත් වේ.

06. (i) බිම්බිසාර, කෝසල - සුද්ධෝදන - මල්ල අජාසත්ත ආදී රජවරු දැක්වූ අනුග්‍රහය විස්තර කරන්න.
* බුදුවීමට පෙර සිට මිත්‍රත්වය පැවැත්වීම.
* බිම්බිසාර පළමු ආරාම පූජාව සිදුකිරීම.
* තම නගරයට බුදුන් වැඩම කර ගැනීම.
* රාජ භටයින් පැවිදි නොකරන ලෙස කළ ඉල්ලීම.
* මගධ දේශයේ බුදු දහම ව්‍යාප්ත වීමට අනුග්‍රහ දැක්වීම.
* කොසොල් රජ නිතර නිතර බුදුන් හමුවීමට යෑම සමීප මිත්‍රත්වයක් ඇතිකර ගනී. බුදුන් ඥාතියෙකු කරගැනීම ''වාසභ ඛත්තියා විවාහ කරගැනීම කාලකාරාම පූජාව.
* අහම්පි කෝසලකෝ ත්වම්පි කෝසලකෝ...
* සුද්ධෝදන බුදුරජාණන් වහන්සේ නොදැක ම දහස් සංඛ්‍යාත පිරිස් සසුනට යොමුකිරීමට දායකත්වය ගැනීම.
* රාජධානියට වැඩම කරවා ගැනීම - දෙමාපිය අවසර නොමැති ව දරුවන් පැවිදි නොකරන ලෙස ඉල්ලීම - ශාක්‍යයන් එක්ව නිග්‍රෝධාරාමය පූජා කිරීම.

* ලිච්ඡවි රජදරුවගේ අපරිහානීය ධර්ම ඇගයීම.
* මල්ල රජදරුවන් ගෞරවාන්විත ආදාහණ උත්සවයක් සිදුකිරීම.
* අජාසත් රජ මුලදී නොමඟ ගියද පසුව සැදැහැවත් රජෙකු වීම.
ආදී තොරතුරු ඇතුළත් කරමින් පිළිතුර ගොඩ නගන්න.

(ii) * ධර්ම විනය සම්බන්ධ දුර්මත නැති කොට හා නිර්මලත්වයට පත්කිරීම.
* බුද්ධ වචනය පිටක වශයෙන් බෙදා දැක්වීම.
විනය පිටකය : * පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි, පරිවාර පාලි
සූත්‍ර පිටකය : දීඝ නිකාය - ආනන්ද හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට පැවරීම.
මජ්ඣිම නිකාය - සැරියුත් හිමිගේ ශිෂ්‍ය පිරිසට පැවරීම
සංයුක්ත නිකාය - මහා කාශ්‍යප හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට පැවරීම.
අංගුත්තර නිකාය - අනුරුද්ධ හිමි ඇතුළු ශිෂ්‍ය පිරිසට පැවරීම
ඛුද්දක නිකාය - සියලු දෙනා වහන්සේට
* ධර්ම විනය ගුරු තන්හි තබා ගැනීම. * ශික්ෂාපද ලිහිල් නොකිරීම.
* අධර්මවාදීන් අවිනයවාදීන් මැඩලීම.
ආදී ක්‍රියාකාරකම් නිසා ශාසන පැවැත්මට ඉගැන් වූ ආකාරය විස්තර කර තිබීම ප්‍රමාණවත්.

(iii) * ථෙරවාදී බුදුදහමේ ශ්‍රී ලාංකික කේන්ද්‍රස්ථානය - මහා විහාරය.
* ලක්දිව බුදු දහම පිහිටවීමෙන් අනතුරුව මහාවිහාර එක ම දම්මැදුර වීම. එය කේන්ද්‍රගත කරගෙන ලක්දිව බුදුදහම ව්‍යාප්තවීම.
* ජාතික - ආගමික විපත්වල මහාවිහාරීය භික්ෂු නායකත්වය ගනී. ථෙරවාදී බුදුදහම දිවිහිමියෙන් රැක ගැනීමට සහායවීම.
* බුද්ධඝෝෂ හිමිගේ දැණුම පිරික්සා හෙළඅටුවා පාලි අටුවා බවටත් කිරීම.
* අධ්‍යාපන ආයතනයක් ලෙස දැයට විවිධ ක්ෂේත්‍ර යටතේ උගතුන් බිහිකිරීම - බුදු දහම - නීතිය - දේශපාලන විද්‍යාව - චිත්‍රකලාව ආදී විෂයධාරාවල නිපුණතා දැයට එක් කිරීම තුළ ජාතික ආගමික - සාමාජික - අධ්‍යාපනික මෙහෙවරක් ඉටුකර ඇති අයුරු.

(iv) * රජුන් පත් කිරීම - ධාතුසේන සිහසුනට රැගෙන ඒම. I විජයබාහු කුමරු යුවරජ ලෙස පත්කිරීම.
* උපදේශකයින් ලෙස ක්‍රියාකිරීම.
මිහිඳු හිමි - දෙවනපෑතිස්ස - උත්තිය යන දෙදෙනාට උපදෙස් දීම.
ගෝදත්ත තෙරුන් - දුටුගැමුණු රජුගේ උපදේශක
කාලබුද්ධරක්ඛිත තෙරුන් - සද්ධාතිස්ස රජගේ උපදේශක
කුපික්කල මහාතිස්ස තෙරුන් - වලගම්බා රජුගේ උපදේශක
සංඝමිත්‍ර - මහසෙන් රජුගේ උපදේශක
* අභිෂේක උත්සව පැවැත්වීම - භික්ෂු ආශිර්වාදය මැද සිදුවිය. දෙවනපෑතිස්ස රජ දෙවන වරට අභිෂේප කිරීම.
* රාජකීයන් සමගි කිරීම - ගැමුනු තිස්ස - අරගලය, වළගම්බා හා ඇමතියකුගේ අරගලය. මිහිඳු යුවරජ හා II සේන අසමගිය, මහාහරණ හා II ගජබා අතර අරගලය ආදිය සමතයකට පත්කිරීම.
* බුදු සසුනට ලක් රජය පිදීම. * නුසුදුසු පාලකයින් නෙරපා හැරීම.
* භාතිකාභය රජ දවස අමාත්‍ය ධූර භික්ෂූන්ට පිරිනැමීම ආදිය විස්තර කරමින් පිළිතුර ගොඩනගන්න.

07. (i) (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය) උට්ඨාන වීර්යෙන් දෑත දෙපයේ මහන්සියෙන් ඩහදිය මුගුරු වගුරා ධාර්මිකව ධනය ඉපැයිය යුතුයි.
* උට්ඨාන විරියාධි ගතෙහි බාහුබල පරිචිතේහි සේදාවක්ඛිත්තේහි ධම්මිකේහි ධම්ම ලද්දේහි''
* සාහසික ලෙස ධනය රැස්කිරීම අකුසල් රැස්කිරීමකි.
* ශ්‍රමය වැයකොට ධනය උත්පාදනය කළයුතු බව පත්තකම්ම - අණන යන සූත්‍රවලින් විස්තර කරයි.
* කෘෂිකර්මය- වෙළඳම - ගව පාලනය - හමුදාසේවය - රාජ්‍ය සේවය - වෙනත් ශිල්ප කටයුතු මගින් ධනය ඉපැයිය හැකි ය.
* වණිජ්ජ සූත්‍රයේදී තහනම් වෙළඳම් 5ක් පෙන්වයි.
* තුලා කුට මානකුට ආදී කුටෝපක්‍රමයන්ගෙන් බැහැර විය යුතුයි.
* වේයා තුඹස බඳින්නාක් මෙන්, මල නොතලා රොන් ගන්නා බඹරකු පරිද්දෙන් දැහැමෙන් ධනය උත්පාදනය කළ යුතුය.

(ii) * ධන පරිහරණයට වැදගත් උපදෙස් 4 ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වේ.
1. උට්ඨාන සම්පදා 2. ආරක්ඛ සම්පදා 3. කල්‍යාණ මිත්තතා 4. සමජීවකතා
* උදම්බර ඛාදික ක්‍රමය - හා අජද්දුමාරික ක්‍රමය ධනය සම්බන්ධ සුදුසු නැත.
* සිගාලෝවාද සූත්‍රයෙන්- ධනය කොටස් 4 බෙදා දක්වයි. - ''ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය''
* පත්තකම්ම සූත්‍රයේදී - තමන්ගේ - මව්පියන්ගේ - ඥාතීන්ගේ සුබවිහරණයට ධනය යෙදියයුතු බව දක්වයි.
* පඤ්චබලි පැවැත්විය යුතුබව දක්වයි.
* ධනය පිරිහෙන කරුණු - භෝග විනාශ මුඛ වසාගත යුතු බව සිගාලෝවාද සූත්‍රයෙන් දක්වයි.

(iii) * භෞතික හා මානව සම්පත් ඵලදායී ව කාර්යක්ෂමව යොදාගැනීම
* ව්‍යග්ගපජ්ජ සූත්‍රයේදී ගෘහස්ථ සම්පත් කළමනාකරණ කරන අයුරු පහදයි.
* අය වැය ඉතා හොඳින් දැන කළ යුතු ය.
* සිගාලෝවාද සූත්‍රයේ එන ඒකේන භෝගෙ භුඤ්ජෙය්‍ය''
* සංඝ සමාජයේ දැකගත හැකි සම්පත් කළමනාකරණය චීවරය - පාත්‍රය පරිහරණය
* වත්පිළිවෙත් ඉටුකිරීමමගින්ද සම්පත් කළමණාකරණය වේ.
* සුලබ හා දුලබ සම්පත් තේරුම්ගෙන කළමනාකරණයෙන් පරිහරණය කිරීම තුළ යහපත් සමාජයක් ගොඩනැගෙන ආකාරය.

(v) * කුමන දිවි පෙවතක් ගතකරන කෙනෙකුට වුව ද පරිසරයේ ඇති ප්‍රයෝජනත්වය
* ජීව - අජීව පරිසරය හඳුනාගැනීම. * ''ආරාම රෝපා වන රෝපා''
* ''වනං ඡින්දථ මා රුක්ඛං'' - කෙලෙස් නැමැති වනය විනාශ කරන්න ගස්වැල් විනාශ නොකළ යුතු ය.
* බුද්ධචරිතය පරිසරය බද්ධ වූ ආකාරය - උපත -බුදුවීම ආදී.
*විනය පිටකයේදී භික්ෂූන්ට දී ඇති අවවාද.
* ඉඳුල් දැමීම - අතුකොළකඩා දැමීම - වතුරට කෙළ ගැසීම නොකළ යුතු ය.
* ජීව පරිසරය පක්ෂි සිව්පා ආදී සතුන් මිනිසාට අමිල සේවයක් කරනු ලබයි.
* පරිසරය විනාශය නිසා ඕසෝන් ස්ථරය පවා විනාශවීම ආදී කරුණු දැක්වීම ප්‍රමාණවත්.

08. (i) හොඳ - ප්‍රතිජනනාත්මකය. නරක - නිශේධාත්මකය.
* නුවණැත්තන්ගෙන් උපදෙස් ලබා හොඳ දේ හඳුනා ගත යුතුයි.
(නව බුද්ධං සමාචරේ කිඤ්චියේන විඤ්ඤූපරේ උපවදෙය්‍යුං)
* බුදු දහම නරක බැහැර කොට හොඳ සමීප කරවයි.
* රාහුලෝවාද සූත්‍රයට අනුව විමසිලිමත් බව ඉතා වැදගත්.
පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායෙන - වාචාය - මනසා කාතබ්බං
* රාහුලෝවාද සූත්‍රයේදී * නෙව අත්තව්‍යාබාධය
* නෙව පරව්‍යාබාධය
* නෙව උභයව්‍යාබාධය
* පරිනිබ්බාන සූත්‍රය - * අත්තාධිපතෙය්‍ය * ධම්මාධිපතෙය්‍ය * ලෝකාධිපතෙය්‍ය
* අත්තූපනායික ධර්මපරියා - තමා උපමාකර ගැනීම.
* සමාජය දෙස බැලීමේදී ද හොඳ නරක වෙන්කරගත හැකි ය.

(ii) බුදුසමය පුද්ගල දිවියට සෞන්දර්ය අවශ්‍ය බව පෙන්වයි. ඇලීමකින් තොරව සෞන්දර්ය ආශ්වාද කිරීමට මග කියයි.
* ඇලීමකින් තොරව විරාගී තුමෝ රසවින්දනය කරති. * ''ආනන්ද වේසාලියං රමණීයං''
* පඤ්ච සිඛගේ ගීත වාදනය අගය කිරීම.
* ආස්වාදයේ උත්තම අවස්ථාව ආනන්දයයි. එය රතියෙන් තොරය.
* රමණීය - ප්‍රියංකර - චමත්කාර දේ ඇසුරින් ආනන්දය ලැබේ.
* භාවානුයෝගී ශ්‍රාවකයන් සෞන්දර්ය දුටුවේ භාවනා කර්මස්ථාන විලස ය.
* ථෙර ගාථා ඇසුරින් විස්තර කිරීම ප්‍රමාණවත්.

(iii) විජය රජුගේ පුරෝහිතයා උපතිස්ස බමුණාය. උපතිස්ස නුවර උපතිස්ස බ්‍රාහ්මණයාගේ නිර්මාණය පණ්ඩුකාභය ශිල්ප උගත්තේ පණ්ඩුල බමුණාගෙන් ය. පණ්ඩුකාභයගේ පුරෝහිතයා චන්ද්‍ර බමුණා ය.
* පණ්ඩුකාභය - බමුණන්ට සොත්ථිශාලා, සිවිකාශාලා, ඇති කිරීම.
* තිවක්ක බමුණුගම බෝධි ආගමනයේදී තිවක්ක සම්බන්ධ වීම.

(iv) * වළගම්බා රජ දවස අභයගිරිය ඉදිකිරීම. මහාතිස්ස හිමියන් - වළගම්බාට උදව් කිරීම.
* ධම්මරුචි භික්ෂුව - අභයගිරියට පැමිණීම.
* වෛතුල්‍යවාදී අදහස් ගරුකිරීම (අභය ගිරිකයෝ)
* වෝහාරික තිස්ස රජ දවස වෛතුල්‍යවාදී මත ප්‍රචලිත වීම.
* ගෝඨාභය රජ දවස වෛතුල්‍යවාදී මත සැබෑ බුදුදහම ලෙස දැක්වීම.
* ගෝඨාභය කල සංඝමිත්‍රගේ පැමිණීම.
* සංඝමිත්‍රට ශිල්ප ඉගැන්වීමට දරුවන් භාරදීම.
* මහසෙන් පක්ෂපාතී වීම.
* උපායශීලී සංඝමිත්‍ර මහසෙන් ලවා මහා විහාර විනාශ කිරීම ආදී කරුණු ඇතුළත් විය යුතුයි.

**(මෙම දෙවන පත්‍රයේ පළමු කොටසට ලකුණු හතර බැගින් ද, දෙවන කොටසක පහ බැගින් ද පිරිනමන්න.)**